තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

10 ශ්‍රේණිය

කාර්ය පත්‍රිකා සංග්‍රහය

කලාප අධ්‍යාපන කාර්යාලය

අම්පාර

1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - 10 ශ්‍රේණිය

සැකසුම -: ජී.එස්.එම්.මහේෂිකා පාසල -: අම්/උහන ජාතික පාසල, උහන

❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. දත්ත හා තොරතුරු සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමන ප්‍රකාශනය ද ?

A. කාලානුරූපී බව සහ සම්පූර්ණ බව තොරතුරක ලක්ෂණ දෙකක් වේ.

B. තනිව ගත් කල දත්ත වලට අර්ථයක් නැත.

C. දත්ත තොරතුරු මත රඳා පවතී.

(1) a සහ b (2) a සහ c (3)b සහ c (4) ඉහත සියල්ලම

02. සියලුම සිසුන්ගේ ගණිත <u>ලකුණු</u> රැස් කර ඒවායේ <u>මධ්‍යනය</u> සොයන ලෙස පන්ති භාර ගුරුතුමිය ප්‍රකාශ කරන ලද. මෙහි ඉරි ඇඳි පද සඳහා වඩාත් සුදුසු හැඳින්වීම් වන්නේ,

(1) දත්ත හා තොරතුරු (2) තොරතුරු හා දත්ත (3) පද දෙකම තොරතුරු (4) පද දෙකම දත්ත

03. තානාපති කාර්යාල විස්තර, රේගු විස්තර ආදී දේ ලබාදෙන්නේ ඉ- රාජ්‍යයේ පහත කවර සම්බන්ධතාවයකින්ද ?

(1) G2C (2) G2G (3) G2B (4) G2E

04. Telemedicine සඳහා උචිත පිළිතුරක් නොවන්නේ,

(1) දුරස්ථ සෞඛ්‍ය උපටැන් (2) දුරකථනයෙන් වෛද්‍යවරයෙකු වැනල් කිරීම

(3) නිවසේ සිට අධීක්ෂණය (4) ශෛහස්ථ ශල්‍යකර්ම

05. ආචයනය කරන ලද ක්‍රමලේඛන සංකල්පය (Stored program concept) හඳුන්වාදෙන ලද්දේ,

(1) පළමු පරම්පරාවේ පරිගණක සමග (2) දෙවන පරම්පරාවේ පරිගණක සමග

(3) තෙවන පරම්පරාවේ පරිගණක සමග (4) හතරවන පරම්පරාවේ පරිගණක සමග

06. “ජංගම දුරකථනයක් භාවිතයෙන් QR කේතයක් කියවා අන්තර්ජාලයට පිවිසිය හැකිය. අදාල වෙබ් අඩවියෙන් දත්ත ලබාගෙන ජංගම දුරකථනය හරහා අදාළ තොරතුරු පෙන්විය හැකිය.” මෙම සිද්ධියට අදාළව ආදාන, සැකසුම් හා ප්‍රතිදාන සඳහා ගැලපෙන උදාහරණ පිළිවෙලින් පෙන්වන පිළිතුරු තෝරන්න.

(1) QR කේතය, අන්තර්ජාලයට සම්බන්ධවීම, තොරතුරු ලබාදීම

(2) තොරතුරු, තොරතුරු ලබාදීම, තොරතුරු

(3) QR කේතය, වෙබ් අඩවියෙන් තොරතුරු ලබාදීම, තොරතුරු

(4) තොරතුරු, අන්තර්ජාලයට සම්බන්ධවීම, QR කේතය

07. තොරතුරු සන්නිවේදනයේ අහිසි ප්‍රතිඵලයක් නොවන්නේ,

(1) ඇබ්බැහි වීම (2) නොගැළපෙන මිතුරන් හමුවීම

(3) දුරස්ථ අධ්‍යාපනය (4) පෞද්ගලිකත්වයට හානි වන පින්තූර හා වීඩියෝ පට විකෘති කර දැමීම

08. ශරීර අභ්‍යන්තර කොටස් වෙන් වෙන්ව ත්‍රිමාණ ලෙස රූපගත කිරීම් පහත කිනම් උපකරණයකින් සිදුකරයි ද ?

(1) CAT (2) ECG (3) EEG (4) MRI

09. පහත සඳහන් වෙබ් අඩවි අතරින් අධ්‍යාපනයික වෙබ් අඩවියක් නොවන්නේ,

(1) <u>www.gov.lk</u> (2) <u>www.e-thaksalawa.moe.gov.lk</u> (3) <u>www.vidumanpetha.com</u> (4) <u>www.nenasala.lk</u>

10. රෙදි වියන යන්ත්‍ර වල රටා ඇති කිරීම සඳහා සිදුරුපත් සංකල්පය භාවිතා කරන ලද්දේ කවුද?

(1) Joseph Jacquard (2) Charles Babbage (3) Howard Aiken (4) Blaise Pascal

01.

I. දත්ත හා තොරතුරු නිදසුන් දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

II. තොරතුරු පද්ධතියක් යනු කුමක්ද?

III. පරිගණක පද්ධතියක සංඝටක ඇඳ නම් කරන්න.

IV. ගුණාත්මක තොරතුරක ලක්ෂණ 5ක් ලියා දක්වන්න.

02.

I. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යනු කුමක්ද?

II. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ අහිසි ප්‍රතිඵල මොනවාද යැයි ලියා දක්වන්න.

03.

I. පන්ති කාමරයේ දී සිසුන්ට අධ්‍යාපන කටයුතු සඳහා, පරිගණකය සහ අන්තර්ජාල පහසුකම් විවිධාකාරයෙන් යොදා ගනු ලබන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

II. ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් තුළින් පාසල් ශිෂ්‍යයාට හා පාසල් කළමනාකාරිත්වයට ඇති පහසුකම් මොනවාදැයි වගුගත කරන්න.

III. දුරස්ථ අධ්‍යාපනයේ යනු කුමක්ද ? එහි ලක්ෂණ 5ක් ලියා දක්වන්න.

04.

I. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දී ඉතා දියුණු තාක්ෂණයෙන් යුක්ත නවීන යන්ත්‍රෝපකරණ විශාල සංඛ්‍යාවක් භාවිතා කරයි. එම උපාංග නම් කර හා ඒවායින් කරන කාර්යය ලියා දක්වන්න.

II. දුරස්ථ සෞඛ්‍ය රැකවරණය යනු කුමක්දැයි හඳුන්වා, ඔබට ඉන් අත්වන වාසි කිහිපයක් ලියා දක්වන්න.

III. ධීවර කර්මාන්තයේදී හා සත්ව ගොවිපල සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

IV. කර්මාන්ත හා ව්‍යාපාර සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම නිසා සිදුවී ඇති වාසි මොනවාද ?

V. ගමනාගමනය සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගන්නා අවස්ථා 3 ක් ලියා දක්වන්න.

VI. විනෝදාස්වාදය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කරන අවස්ථා මොනවාද ?

05.

I. පරිගණක පරම්පරා 5 නම් කර, ඒ එක් එක් පරම්පරාවේදී භාවිතා කළ ප්‍රධාන දෘඩාංග තාක්ෂණය, භාවිතා කරන ලද මෘදුකාංග, ලක්ෂණ හා නිර්මාණය වූ පද්ධති මොනවාදැයි වගුගත කර දක්වන්න.

II. පරිගණක පරිණාමයේ වැදගත් අවස්ථාවන් හා ඒවාට මූලිකත්වය දුන් පුද්ගලයන් දැක්වෙන වගුවක් පහත දැක්වේ. එම තීරු දෙක නිවැරදිව ගළපන්න.

A	B
සිදුරුපත් සංකල්පය	Gottfried Wilhelm
පළමු පරිගණක වැඩසටහන් ශිල්පිනිය	Charles Babbage
පැස්කල්ගේ යන්ත්‍රය වැඩි දියුණු කිරීම	Joseph Jacquard
ගණක යන්ත්‍රය	Ada Augasta
Mark 1	Blaise Pascal
Analytical Engine	Howard Aiken

2. පරිගණකය හඳුනා ගනිමු - 10 ශ්‍රේණිය

සැකසුම -: ජී.එස්.එම්.මහේෂිකා පාසල -: අම්/උහන ජාතික පාසල, උහන

❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. මේ අතරින් දැක්වීමේ උපාංගයක් සඳහා උදාහරණයක් වන්නේ,

(1) Keyboard (2) Digital Camera (3) Scanner (4) Barcode Reader

02. විභාග බහුවරණ උත්තර පත්‍ර ලකුණු කිරීමට යොදාගත හැකි වඩාත් යෝග්‍ය තාක්ෂණය කුමක්ද ?

(1) MICR (2) OCR (3) OMR (4) QR CODE

03. මින් සට්ටන මුද්‍රණ යන්ත්‍රයක් වන්නේ,

(1) තිත් න්‍යාස මුද්‍රකය (2) ලේසර් මුද්‍රකය (3) තාප මුද්‍රකය (4) තීන්ත විදුම් මුද්‍රකය

04. මධ්‍ය සැකසුම් ඒකකයට අදාල කොටස් වන්නේ,

A. වාරක මතකය B. මතක රෙජිස්තර C. පාලන ඒකකය

D. අංක ගණිතමය හා තාර්කික ඒකකය E. සසම්භාවී ප්‍රවේශ මතකය

(1) A,B,C (2) B,C,D (3) B,E,D (4) A,B,C,D,E

05. මධ්‍ය සැකසුම් ඒකකයේ වේගය මැනීමට වඩාත් යෝග්‍ය මිනුම වන්නේ,

(1) KB (2) Byte (3) Mbph (4) Mhz

06. වාරක මතකය තුළ ගබඩා වන දත්ත පිළිබඳ නිවැරදි ප්‍රකාශන නම්,

(1) පරිගණක සකසනයට නිතර අවශ්‍ය වන දත්ත තාවකාලිකව රඳවා තබා ගනී.

(2) පරිගණක සකසනයට නිතර අවශ්‍ය වන දත්ත ස්ථිරව රඳවා තබා ගනියි.

(3) දත්ත හා තොරතුරු ස්ථිරව ගබඩා කර තබා ගනියි.

(4) පරිගණක සකසනයට නිතර අවශ්‍ය නොවන දත්ත තාවකාලිකව රඳවා තබා ගනී.

07. චුම්බක මාධ්‍ය උපක්‍රමයක් නොවන්නේ,

(1) දෘඩ තැටිය (2) නම්‍ය තැටිය (3) චුම්බක පටිය (4) බ්ලූරේ තැටිය

08. මේ අතරින් සත්‍ය වගන්තිය තෝරන්න.

A - යතුරු පුවරුව සම්බන්ධ කිරීමට PS/2 කොළපාට කෙවෙනිය යොදා ගනියි.

B - මුද්‍රණ යන්ත්‍රය සම්බන්ධ කිරීමට සමාන්තර කෙවෙනිය යොදාගනී.

C - RJ45 කෙවෙනියට router හා network switch සම්බන්ධ කල හැක.

D - වීඩියෝ කෙවෙනිය සඳහා පරිගණක තිරය හා බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය සම්බන්ධ කළ හැකිය.

(1) D,C,B,A (2) C,B,D (3) B පමණි (4) A,D පමණි

09. වඩාත් වේගවත්ම සම්ප්‍රේෂණ මාධ්‍යය වන්නේ,

(1) ගුවන් විදුලි තරංග (2) ප්‍රකාශ තන්තු (3) අධෝරක්ත කිරණ (4) ඇඹරූ කම්බි යුගල

10. පරිගණක ජාලයක් ආරක්ෂා කළ හැකි උපාංගයක් වන්නේ,

(1) රවුටරය (2) ස්විචය (3) ගිනි පවුර (4) UPS එක

01.

I. පරිගණකයක් යනු කුමක්ද ?

II. පරිගණකයෙහි ඇති විශේෂ ලක්ෂණ පහක් ලියා දක්වන්න.

III. භෞතික ප්‍රමාණය හා නිර්මාණ තාක්ෂණය අනුව පරිගණක වර්ග කරන්න.

02.

I. පහත දැක්වෙන උපාංග ආදාන හා ප්‍රතිදාන උපාංග ලෙස වෙන්කොට දක්වන්න.
(Joystick, CCTV, Monitor, Light Pen, Multimedia Projector, Microphone, Mouse, Printer, Digital Camera, Scanner, Speakers, ATM, Barcode Reader, Keyboard, MICR)

II. මධ්‍ය සැකසුම් ඒකකය බෙදෙන ප්‍රධාන කොටස් තුන නම්කර, එහි ක්‍රියාකාරීත්වය ලියා දක්වන්න.

III. පහත ප්‍රකාශ හරි (√) හෝ වැරදි (X) ලෙස ප්‍රකාශ කරන්න.

A. RAM එක මධ්‍ය සැකසුම් ඒකකය තුළ පිහිටා ඇත. (.......)

B. ROM එකෙහි පවතින්නේ නශ්‍ය මතකයකි. (.......)

C. වාරක මතකය අනෙකුත් මතක වලට වඩා ප්‍රමාණයෙන් කුඩා වුවත්, ඉතා වේගවත්ය. (.......)

D. පරිගණක සකසනයට නිතර අවශ්‍ය වන දත්ත තාවකාලිකව රඳවා තබා ගන්නා වේගවත්ම මතකය දෘඩ තැටියයි. (.......)

E. පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි, වේගවත් දත්ත හැසිරවීමේ හැකියාවක් සැනෙලි ධාවකය සතුවේ. (.......)

03. පරිගණක කෙවෙනි හඳුනාගනිමින් පහත දැක්වෙන A තීරුව B තීරුව සමඟ ගළපන්න.

A	B
PS/2 කෙවෙනි	පරිගණක තිරය, බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය, ඩිජිටල් රූපවාහිනී යන්ත්‍ර හා ශබ්දවාහිනී යන්ත්‍ර
ශබ්ද උපාංග කෙවෙනි	පරිගණක ජාලයක ඇති පරිගණක, ජාල මං හසුරුව, ජාල ස්විච්ය
සමාන්තර කෙවෙනි	මයික්‍රොෆෝනය, ස්පීකරය, ඉස් බනුව
USB කෙවෙනි	පරිගණක තිරය, බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය
RJ 45 කෙවෙනි	යතුරුපුවරුව, මූසිකය
HDMI කෙවෙනි	මොඩමය
Video කෙවෙනි	මුද්‍රණ යන්ත්‍ර
ශ්‍රේණිගත කෙවෙනි	යතුරු පුවරුව, මූසිකය, මුද්‍රණ යන්ත්‍රය, සුපරික්සකය ,සැනෙලි ධාවකය

04.

i. දත්ත සන්නිවේදනය සඳහා අවශ්‍ය මූලික අංග මොනවාද ?

ii. දත්ත සම්ප්‍රේෂණ විධි උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. පහත දැක්වෙන සම්ප්‍රේෂණ මාධ්‍යය නියම මාධ්‍ය හා නියමු නොවන මාධ්‍ය ලෙස වෙන් කර දක්වන්න.
(ඇඹරූ කම්බි යුගල, ක්ෂුද්‍ර තරංග, සමක්ෂක කේබලය, අධෝරක්ත කිරණ, ගුවන් විදුලි තරංග, ප්‍රකාශ තන්තු)

05.

i. පරිගණක ජාලයක් ඇති කිරීමට පරිගණක දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තිබිය යුතුය. මෙම පරිගණක එකිනෙකට සම්බන්ධ කිරීම සඳහා යොදාගනු ලබන උපාංග ලැයිස්තුගත කරන්න.

ii. සේවාලාභී පරිගණක හා සේවාදායක පරිගණක අතර වෙනස පහදන්න.

iii. පරිගණක ජාල වර්ග මොනවාද ? උදාහරණ දෙන්න.

iv. විවිධාකාර වූ ජාල ස්ථල විද්‍යා නම් කර, ඒවා ඇඳ දක්වන්න.

v. ජාලකරණයේ වාසි හා අවාසි මොනවාද ?

0773530145

පරිගණකයේ දත්ත නියෝජනය වන ආකාරය - 10 ශ්‍රේණිය

සැකසුම-ටෙනිසන් චන්ද්‍රසිරි අම්/හිඟුරාණ ම.වි.

1. පහත ප්‍රකාශ වලින් අසත්‍ය වන්නේ
   1) 0,1,2,3,4,5,6,7,8,9,A,B,C,D,E,F යනු ෂඩ්දශමය සංඛ්‍යා පද්ධතියේ සංඛ්‍යා සංකේත වේ.
   2) අෂ්ටමය සංඛ්‍යා පද්ධතියේ පාදක අගය 7 ය.
   3) සංඛ්‍යාංක පරිගණකයක සියලු ක්‍රියාකාරිකවයන් ද්විමය සංඛ්‍යා කේත මූලික කොට ගෙන සිදු කෙරේ.
   4) අප එදිනෙදා කටයුතු සඳහා භාවිතා කරනු ලබන්නේ දශමය සංඛ්‍යා පද්දධතියයි.
2. 30_{10} සංඛ්‍යාව16 පාදයෙන් ලියූවිට පිළිතුර වන්නේ
   1) 1E
   2) 14
   3) 114
   4) AE

3. 1110_2 හි අගය 16 පාදයෙන් ලියූ විට පිළිතුර වන්නේ
   1) 14
   2) 10
   3) E
   4) 7

4. 1111001 ද්විමය සංඛ්‍යාවේ වැඩිම වෙසෙසි අගය දැක්වෙන ඉලක්කමේ දශමක අගය වන්නේ.

   1) 32
   2) 64
   3) 1
   4) 5

5. AA_{16},77_8,111000_2 යන සංඛ්‍යා දශමක අගයන්ගෙන් දැක්වූවිට
   1) 170,63,56
   2) 20,14,70
   3) 170,73,112
   4) 170,63,112

   5)
6. සමාන සංඛ්‍යා යුගල වනුයේ
   1) $100_2=10_{10}$
   2) $11_2 = 11_8$
   3) $10_{16}=16_{10}$
   4) $18_{16} =28_{10}$

7. රටාව අනුව ඊලඟට එන සංඛ්‍යාව වනුයේ. 110_2 , 1001_2 , 1100_2, ---------------
   1) 1111_2
   2) 1011_2
   3) 1110_2
   4) 0111_2

8. $11_8 + 7_8$ හි පිළිතුර වන්නේ
   1) 18_8
   2) 27_8
   3) 16_8
   4) 20_8

9. BCD කේතවලින් දක්වා ඇති 1000+0101 යන සංඛ්‍යා දෙකෙහි එකතුව BCD කේතවලින්ම දැක්වූ විට
   1) 1101
   2) 10000101
   3) 00010011
   4) 13
10. ඇස්කි කේතවලින් A= 1000001 නම් K අකුරෙහි ඇස්කි කේත වන්නේ
   1) 1001011
   2) 1001010
   3) 1001110
   4) 1000111

(1)ද්විමය,අෂ්ඨමය,දශමය හා ෂඩ් දශමය සංඛ්‍යා පද්ධති වලින් දකුණේ සිට වමට එකස්ථානයේ සිට ස්ථාන හතරක සංඛ්‍යා දක්වන්න.

4	3	2	1	⇦ ස්ථානය
				2 පාදය
				8 පාදය
1000	100	10	1	10 පාදය
				16 පාදය

(2).1 සිට 20 දක්වා පහත දැක්වෙන සංඛ්‍යා පද්ධතිවලින් ලියන්න.

දශමය	ද්විමය	අෂ්ඨමය	ෂඩ් දශමය
1			
2			
3			
4			
5			
6			
7			
8			
9			
10			
11			
12			
13			
14			
15			
16			
17			
18			
19			
20			

(3).හිස්තැන්වලට ගැළපෙන සංඛ්‍යා අදාල පාදයට අනුව ලියන්න

a. 10_{10}= $_____{8}$= $______{2}$ = $_____{16}$
b. 10_{2} = $____{8}$ = $_____{10}$ = $_____{16}$
c. 10_{8} = $_____{10}$ = $_____{2}$ = $_____{16}$
d. 10_{16} = $_____{10}$ = $______{2}$ = $_____{8}$
e. 100_{2} = $_____{10}$
f. 100_{8} = $_____{10}$
g. 100_{16} = $_____{10}$
h. 1000_{2} = $____{10}$
i. 1001_{2}= $____{10}$
j. $2A_{16}$= $_____{10}$

තාර්කික ද්වාර හා බූලියානු නියම - 10 ශ්‍රේණිය

සැකසුම-ටෙනිසන් චන්ද්‍රසිරි

අම්/හිඟුරාණ ම.වි.

1. පහත ප්‍රකාශන අතරින් අසත්‍ය වන්නේ
   - A. ගිරවා පක්ෂියෙකි සහ ගිරවා බිත්තර දමයි
   - B. නැගෙනහිරෙන් හිරු පායයි සහ බටහිරෙන් හිරු බැස යයි
   - C. රෑට තරු පායයි හෝ දවල්ට හිරු පායයි
   - D. හරකාට අත්තටු නොතිබේ හෝ නයාට කකුල් ඇත
2. අගය 1 ලැබෙන්නේ කුමන අවස්ථාවේදීද?
   - A. 1.0 +0.1
   - B. (0+0)(0+1)
   - C. (1+1+1)(1.0)
   - D. 1.0.0 + 0.1
3. බූලීය ආකලනය දැක්වෙන ප්‍රකාශනය වන්නේ
   - A. A OR B
   - B. A AND B
   - C. NOT A
   - D. A.B
4. පහත දැක්වෙන්නේ කුමන තාර්කික ද්වාරයට අදාල සත්‍යතා වගුවද
   - A. AND
   - B. NAND
   - C. NOR
   - D. OR

A	B	X
0	0	1
0	1	0
1	0	0
1	1	0

5. පහත තාර්කික ද්වාර පරිපථයට අදාල බූලීය ප්‍රකාශනය වන්නේ
   - A. A.B + B.C
   - B. (A+B)+B.C
   - C. (A+B)(B+C)
   - D. A.B+C



6. AND,OR,NAND,NOR යන තාර්කික ද්වාර වලින් අදාන ලෙස 1 හා 0 ඇතුළත් කළ විට ප්‍රතිදානය 1 ක් ලෙස ලැබෙන්නේ
   - A. AND හා NOR මගිනි
   - B. OR හා NAND මගිනි
   - C. NOR හා NAND මගිනි
   - D. OR හා NOR මගිනි
7. නිවසට "සොර සතුරන් ඇතුළුවීම" අනතුරු හඟවන උපක්‍රමයක ස්විචය දමා ඇති විට දී සොරෙකු ඇතුළු වුවහොත් චලන සංවේදකයෙන් 1 නිකුත්වීම නිසා සංඥාවක් නිකුත් කරයි.එයට අදාල විද්‍යුත් පරිපථය වන්නේ

i. 

ii. 

iii.

iv. 

8. පහත ප්‍රකාශ සලකා බලන්න

A. NOT ද්වාරයක ප්‍රතිදාන නැවත NOT ද්වාරයකට අදානය කළ විට මුල් ආදානයෙහි අගයම ලැබේ.

B. NOR ද්වාරයක සියලු අදානයන් 0 වූ විට ප්‍රතිදානය 1 වේ.

C. ආදන ලෙස 1 හා 0 ලබාදුන් විට NAND ද්වාරයේ ප්‍රතිදානය 1 වේ.

මින් සත්‍ය වන්නේ

a. A හා B
b. B හා C
c. A හා C
d. A B C යන සියල්ල

1. එක්තරා බැංකුවකට ඇතුළුවීමට ස්වයංක්‍රීයව විවෘතවන දොරක් තිබේ. දොර විවෘතව ඇති අවස්ථා වලදී කොලපාට බල්බයක් ද විවෘතව නැති අවස්ථාවලදී රතුපාට බල්බයක්ද දැල් වේ.බල්බ දැල්වීම සඳහා පරිපථය පහත ද්වාර භාවිතයෙන් අඳින්න.(දොර විවෘතවීම=True)

2.

a. ඉහත ක්‍රියාවලිය දැක්වීම විවෘත, වැසූ ,කොලබල්බය දැල්වේ, කොලබල්බය නොදැල්වේ, රතුබල්බය දැල්වේ, රතුබල්බය නොදැල්වේ යන වචන භාවිතා කරමින් පහත සත්‍යතාවගුව සම්පූර්ණ කරන්න

ඇතුළුවන දොර=A

A		

3. යතුරු පැදියක් ගියර දමා ඇති විට හෝ ස්ටෑන්ඩ් සිටුවනය සිටුවා ඇති විට හෝ එකවර එම අවස්ථා දෙකෙහිම ඇති විට පනගැන්වීම සිදු නොවන ලෙස සකස් කළ පරිපථය පහතින් දක්වා ඇත එයට සුදුසු තාරකික ද්වාරය කොටුව තුළ ඇඳ දක්වන්න(ගියර දමා ඇති අවස්ථාව=1 හා සිටුවනය සිටුවා ඇති අවස්ථාව =1 වේ)



මෙහෙයුම් පද්ධති - 10 ශ්‍රේණිය

සැකසුම - එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා පාසල - බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල, අම්පාර

- ආදරණීය දුවේ, පුතේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පෙළ පොතේ පස්වන ඒකකය නැවත කියවා ඔබේ මතකය ආවර්ජනය කර මෙම කාර්යය පත්‍රිකාව සිදුකරන්න.

1 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. මෘදුකාංග ප්‍රධාන වශයෙන් බෙදිය හැකි ක්‍රම 2 වන්නේ,

a. අවශ්‍යතා මත හා අසුරුම්ගත මෘදුකාංග b. විධාන රේඛා හා චිත්‍රක පරිශීලක අතුරුමුහුණත්

c. පද්ධති මෘදුකාංග හා යෙදුම් මෘදුකාංග d. මෙහෙයුම් පද්ධති හා සම්පාදක මෘදුකාංග

2. පහත ඒවායින් පද්ධති මෘදුකාංගයක් නොවන්නේ,

a. පැතුරුම්පත් මෘදුකාංග b. උපක්‍රම ධාවක මෘදුකාංග

c. ප්‍රති වයිරස මෘදුකාංග d. මෙහෙයුම් පද්ධති

3. නිදහස් හා විවෘත කේත මෘදුකාංග යනු,

a. නිදහසේ භාවිත කල හැකි ඒවා වේ.

b. විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ භාවිත කල හැකි මෘදුකාංග වේ.

c. නොමිලේ ලබාගත හැකි මෙන්ම ප්‍රභව කේතය ලබා ගත හැකි ඒවා වේ.

d. භාවිතය සඳහා සීමාවන් පනවා නැති මෘදුකාංග වේ.

4. නිදහස් හා විවෘත කේත මෘදුකාංගයක් නොවන්නේ පහත කුමක්ද?

a. Windows XP b. Android c. Hanthana Linux d. Ubuntu

5. පඨන මාත්‍ර මතකයෙහි (ROM) ස්ථාපිත, පරිගණකයේ මූලික ක්‍රියාත්මක වීමට අදාළ උපදෙස් විස්තර කිරීමට බහුලව භාවිතාවන නම වනුයේ,

a. මෘදුකාංග b. ස්ථිරාංග c. දෘඩාංග d. ජීවාංග

6. WIMP ලෙස හැඳින්වෙන සංරචක දැක්වෙන මෘදුකාංග වර්ගය වනුයේ,

a. යෙදුම් මෘදුකාංග b. මෙහෙයුම් පද්ධති

c. චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් සහිත මෘදුකාංග d. උපයෝගිතා මෘදුකාංග

7. මකන ලද ගොනු නැවත ස්ථාපිත කිරීමේ නිවැරදි පිළිවෙල වන්නේ,

a. I. Restore කළ යුතු ගොනුව හෝ ෆෝල්ඩරය තෝරන්න. ii. Recycle Bin විවෘත කරන්න. iii. File මෙනුවේ Restore විධානය ලබා දෙන්න.

b. i. Recycle Bin විවෘත කරන්න. ii. Restore කළ යුතු ගොනුව හෝ ෆෝල්ඩරය තෝරන්න. iii. File මෙනුවේ Restore විධානය ලබා දෙන්න.

c. i. Restore කළ යුතු ගොනුව හෝ ෆෝල්ඩරය තෝරන්න. ii. File මෙනුවේ Restore විධානය ලබා දෙන්න. iii. Recycle Bin විවෘත කරන්න

d. i. Recycle Bin විවෘත කරන්න. ii. File මෙනුවේ Restore විධානය ලබා දෙන්න. iii. Restore කළ යුතු ගොනුව හෝ ෆෝල්ඩරය තෝරන්න.

0717381099

8. CMOS යන්නෙන් ප්‍රකාශ වන්නේ,

a. Complementary Metal Oxide Semiconductor
b. Complementary Material Oxide Starter
c. Complementary Metal Oxide Semicoordinator
d. Compulsory Material Oxide Semiconductor

9. වෛරසයන් මිලදී ගැනීමට ඇති උපයෝගීතා මෘදුකාංගයක් වන්නේ,

a. MS Access b. Linux c. MS Windows d. McAfee

10. පහත මෙහෙයුම් පද්ධති අතරින් තත්‍ය කාල, බහුකාර්ය, බහු පරිශීලක, එක පරිශීලක යන මෙහෙයුම් පද්ධතිවලට අයත් මෙහෙයුම් පද්ධති පිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

a. Windows 7, Windows 8, Ubuntu, Mac OS
b. ATM, Windows 8, Windows server, MS DOS
c. ගණක යන්ත්‍ර, Windows 7, Ubuntu, Mac OS
d. MS DOS, ATM, Linux, Mac OS

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. i. මෘදුකාංග බෙදෙන ප්‍රධාන කොටස් 2 ලියන්න.
ii. ඔබ ඉහත සඳහන් කළ එක් මෘදුකාංග වර්ගයක් තවත් කොටස් 3කට බෙදිය හැක. එම කොටස් 3 ලියන්න
iii. පහත දක්වා ඇති රූපවල සඳහන් මෙහෙයුම් පද්ධතියේ නම ලියන්න.



02. සුදුසු වචන යොදා ගනිමින් හිස්තැන් පුරවන්න.
i. එකවර පරිශීලකයන් කිහිපදෙනෙකුට ප්‍රවේශ වී වැඩ කල හැකි පරිගණක පද්ධති .... නමින් හඳුන්වයි.
ii. කාල ප්‍රමාදයකින් තොරව ප්‍රතිචාර දක්වන පරිගණක පද්ධති .... නම් වේ.
iii. Microsoft DOS මෙහෙයුම් පද්ධතිය සහිත පරිගණක වලින් එක් වරකට .... පමණක් ප්‍රවේශ විය හැක.
iv. එක් වරකට කාර්යයන් කිහිපයක් සිදු කළ හැකි මෙහෙයුම් පද්ධති .... නම් වේ.
v. ATM යනු .... මෙහෙයුම් පද්ධතියක් සහිත පරිගණකයකට උදාහරණයකි.

03. I. මෙහෙයුම් පද්ධතියක් මඟින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් දෙක නම් කරන්න.
ii. දෘඩාංග පාලනයේදී කළමනාකරණ කාර්යයන් 6ක් සිදු කරනු ලබයි. ඒවා මොනවාද?
iii. අතුරු මුහුණත් වර්ග දෙකකි ඒවා මොනවාද?
iv. ඉන් එක් අතුරු මුහුණත් වර්ගයක දී WIMP මඟින් හඳුන්වන්නේ මොනවාද?

04. I. උපයෝගීතා වැඩසටහන් යනු මොනවාද?
ii. ඔබ දන්නා උපයෝගීතා වැඩසටහන් 4ක් ලියන්න.
iii. පංගු බෙදීම යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?
Iv. දෘඩ තැටියක පංගු බෙදීම අවශ්‍ය වන්නේ ඇයි?

05. I. සෑම ගොනුවක්ම කොටස් 2කින් සමන්විත වේ. එම කොටස් දෙක ලියන්න. උදාහරණයක් මඟින් පහදන්න
Ii. පහත දැක්වෙන ගොනු වර්ගවල ගොනු දිගුව ලියා දක්වන්න. (උදා- Word - .docx)
a. Audio b. image c. movie d. PowerPoint
Iii. ගොනුවක properties මඟින් ගොනුවක් සම්බන්ධව දැක ගත හැකි කරුණු 3ක් ලියන්න.
iv. ගොනු බහාලුමක් (Folder) නිර්මාණය කර ගන්නා ආකාරය පියවර 3කින් ලියන්න.

6. වදන් සැකසීම - 10 ශ්‍රේණිය

සැකසුම -: ජී.එස්.එම්.මහේෂිකා | පාසල -: අම්/උහන ජාතික පාසල, උහන

❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. Pascal යන වචනය ***Pascal*** ලෙස වෙනස් කිරීමට අදාල වදන් සැකසුම් මෙවලම් වන්නේ,

(1) Subscript (2) Strikethrough (3) Bold & Italic (4) Change case

02. ගොනුවක් Copy කර වෙනත් තැනක Paste කිරීමට භාවිතා කරන කෙටි මං යතුරු වන්නේ,

(1) ctrl+v , ctrl+c (2) ctrl+x, ctrl+z (3) ctrl+c, ctrl+v (4) ctrl+c, ctrl+y

03. ලිපි නිර්මාණය කිරීමෙන් අනතුරුව, ඒ සඳහා අවශ්‍ය ලිපින සහිත දත්ත ප්‍රභවයක් නිර්මාණය කරමින් එම ලිපින, ලිපිය සඳහා යොමු කිරීමට word හි ඇති පහසු ක්‍රියාවලිය වන්නේ,

(1) mail merge (2) word formatting (3) thesaurus (4) translate

04. word ලේඛනයක bus යන වචනය විශාල ප්‍රමාණයක් යෙදී ඇත. එය car ලෙස ප්‍රතිස්ථාපනය විය යුතු නම්, ඒ සඳහා word හි ඇති පහසුකම වන්නේ,

(1) (2)  (3) (4)

05. නිවැරදි වගන්තිය තෝරන්න.

A - ලේඛනයට අලුත් නමක් දීමට ctrl+N යොදා ගනී.

B - වචන ප්‍රතිස්ථාපනය කිරීමට ctrl+H යොදා ගනියි.

C - ctrl+Home මගින් ලේඛනයේ මුලට කර්සරය ගෙන යයි.

D - ctrl+y මගින් redo කරයි.

(1) A,B

(2) B,C,D

(3) D පමණි

(4) ඉහත සඳහන් සියල්ලම

06. සිරස් දිශානතිය (portrait) සහ තිරස් දිශානතිය (landscape) යනු,

(1) පිටුවේ ප්‍රමාණය වේ. (2) පිටු දිශානතිය වේ. (3) පිරිසැලසුම් වේ. (4) ඉහත සියල්ලම වේ.

07. Word ගොනුවක ගොනු දිගුව කුමක්ද ?

(1) exe (2) xlsx (3) docx (4) pptx

08. මේ අතරින් වදන් සැකසුම් මෘදුකාංගයක් වන්නේ,

(1) Numbers (2) Apple Keynote (3) Base (4) Word Perfect

09. වදන් සැකසුම් ලේඛනයක ඇති හිස් වගුවකට පහත කුමන දෑ කළ හැකිද ?

A - වගුවේ කෝෂ වර්ණ ගැන්වීම.

B - වගුවේ යාබද කෝෂ ඒකාබද්ධ කිරීම

C - වගුවට කෝෂ ඇතුලත් කිරීම

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A,B,C සියල්ලම

10. වදන් සැකසුම් මෘදුකාංගයේ ඇතුලත් යන අයිතමය කුමක්ද ?

(1) Picture (2) Crop (3) Format Painter (4) Clip Art

01.පහත වෙනස්කම් හඳුනාගෙන, ඒ සඳහා භාවිතා කර ඇති වදන් සැකසුම් මෙවලම් අංක අනුව නම් කරන්න.



02. වදන් සැකසුම් මෘදුකාංග වල ඇති මෙවලම් ඒවායේ කාර්යය සමග ගලපන්න.

මෙවලම	මෙවලමෙන් කරන කාර්යය
	අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ දෝෂ සෙවීම හා නිවැරදි කිරීම
	තීරු සකස් කිරීම
	වචන දිශානතිය වෙනස් කිරීම
	වගු නිර්මාණය කිරීම
	පිටුවකට පාට යෙදීම හා බෝඩරයක් යෙදීම
	සළකුණු යෙදීම
	තැපැල් මුසුව භාවිතා කිරීම
	ශීර්ෂකය හා පාදකය සැකසීම

03. පහත දැක්වෙන පරිගණක ආශ්‍රිත කාර්යයන් සඳහා භාවිතා කරන **කෙටිමං යතුරු** යොදා හිස්තැන් පුරවන්න.

I. නව ලේඛනයක් විවෘත කිරීමට .... යොදා ගනියි.
II. ලේඛනයට නමක් යොදා සුරැකීමට.................................. යොදා ගනියි.
III. ලේඛනය විවෘත කිරීමට .... යොදා ගනියි.
IV. ලේඛනය තේරීමට .... යොදා ගනියි.
V. කර්සරය ලේඛනයේ අවසානයට ගැනීමට .... යොදා ගනියි.

04. පහත දැක්වෙන අවස්ථාවන් සඳහා භාවිතා කරන මෙවලම් වරහන් තුළින් තෝරා ලියන්න.

(Chart , Shapes, Pictures, Smart Art, Clip Art)







05. පහත වගුවේ වෙනස්කම් සිදුකිරීමට යොදා ගන්නා මෙවලම් මොනවාදැයි ලියා දක්වන්න.



4. ABC හා XYZ වචන වෙනස් කිරීම සඳහා භාවිතාකළ මෙවලම කුමක්ද?

5. අලුතින් තීරුවක් එකතු කිරීමට භාවිතා කරන මෙවලම කුමක්ද ?

6. අලුතින් පේළියක් එකතු කිරීමට භාවිතා කරන මෙවලම කුමක්ද ?

0773530145

විද්‍යුත් පැතුරුම්පත්. – 10 ශ්‍රේණිය.

සැකසුම :- එම්.පී.එම්.ජී. චතුරංගනී පෙරේරා පාසල :- අම්/අඹගහවැල්ල මහා විද්‍යාලය.

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංගය සඳහා උදාහරණයක් නොවන්නේ.
   I. Numbers
   II. Libre Office
   III. Frame Maker
   IV. Excel

2) විද්‍යුත් පැතුරුම්පත් භාවිතයෙන් සිදු කර ගත හැකි කාර්යයක් වන්නේ.
   I. සරල හා සංකීර්ණ ගණනය කිරීම්
   II. චලන රූප නිර්මාණය
   III. ප්‍රස්තාර මඟින් දත්ත නිරූපණය
   IV. දත්ත අනුපිළිවෙලින් දැක්වීම

3) වැඩපතක A1 කෝෂය වෙත ගමන් කිරීමට භාවිතා කරන යතුර වන්නේ.
   I. Ctrl + Home
   II. Page Up
   III. Ctrl + End
   IV. Ctrl+Arrow Keys

4) විද්‍යුත් පැතුරුම්පතක කෝෂයට =(5-2)^3+6/(3*2) සූත්‍රය ඇතුළු කළ විට කුමක් දිස් වේද?
   I. 10
   II. 5.6
   III. 28
   IV. 33

5) $y = x^2-3x+5$ වර්ගයේ ප්‍රස්තාරයක් ඇඳීමට වඩාත් ගැළපෙන ප්‍රස්තාර වර්ගය වන්නේ.
   I. ස්ථම්භ ප්‍රස්තාර
   II. වට ප්‍රස්තාර
   III. රේඛා ප්‍රස්තාර
   IV. XY Scatter ප්‍රස්තාර

6) කෝෂ හැඩසව් කිරීමේ මෙවලමක් නොවන්නේ.
   I **B** II. U III.  IV. *I*

7) කෝෂ එකෙල්ල කිරීම සහ ස්ථාන ගත කිරීමේ මෙවලමක් වන්නේ.
   I.  II. *I* III. U IV. **B**

8) කෝෂයේ ඇති දත්තය මුදල්මය අගයක් බවට පත් කිරීමට යොදා ගන්නා මෙවලම හඳුන්වන්නේ
   I. Number
   II. Percentage
   III. Accounting
   IV. Currency

- 9,10 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත වැඩපත යොදා ගන්න.

	A	B	C	D	E	F
1	නම	විෂය			මුළු ලකුණු	සාමාන්‍යය
2		ගණිතය	විද්‍යාව	ඉංග්‍රීසි		
3	A	85	68	72		
4	B	96	88	75		
5	C	78	97	86		
6	වැඩිම ලකුණු					
7	අඩුම ලකුණු					
8						

9) A ගේ මුළු ලකුණු සෙවීම සඳහා යොදා ගනු ලබන සූත්‍රය වන්නේ.

I.	Sum (B3 : D3)	III.	Sum (A3 : D3)
II.	Sum (A3 : D3)	IV.	Sum(B3 : D3)

10) ගේ වැඩිම ලකුණු සෙවීම සඳහා යොදා ගනු ලබන සූත්‍රය වන්නේ.

I.	Min (B2 : B5)	III.	Min (B3 : B5)
II.	Max (B2 : B5)	IV.	Max (B3 : B5)

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1) විද්‍යුත් පැතුරුම්පත් භාවිතයෙන් ලැබෙන වාසි 03 ක් දක්වන්න.
2) විවිධ නිෂ්පාදන සමාගම් විසින් නිපදවා ඇති විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංග කිහිපයක් නම් කරන්න.
3) වැඩපතක් යන්න හඳුන්වන්න.
4) පහත සූත්‍ර සුළු කිරීමෙන් ලැබෙන අගයන් සොයන්න.

I.	= 50*(20/2^2)	IV.	=100+100/50*3^2
II.	= 60+3*6-12	V.	=(25/5*2)+5^2
III.	= 34-12*2/2		

5) පහත වැඩපත ආශ්‍රය කරගෙන ශ්‍රිත පමණක් යොදා ගනිමින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

	A	B	C	D	E	F	G
1		2020 තෙවන වාරය - තොරතුරු තාක්ෂණය					
2	අංකය	නම	පත්‍රය I MCQ - 30%	පත්‍රය II Essay - 40%	පත්‍රය III Practical - 30%	මුළු එකතුව	සාමාන්‍ය අගය
3	A1	නිමන්ත	25	35	28		
4	A2	දුලාෂි	10	0	ab		
5	A3	සඳෙව්නා	18	23	27		
6	A4	සාවිනි	24	38	28		
7	A5	මහේෂ්	29	39	30		
8							
9		ඉහළම ලකුණ					
10		අඩුම ලකුණ					
11		පැමිණි සංඛ්‍යාව					
12		මුළු සිසු සංඛ්‍යාව					

I. නිමන්ත ලබාගත් ලකුණුවල එකතුව සෙවීමට F3 කෝෂයට ඇතුළත් කළ යුතු ශ්‍රිතය කුමක්ද?

II. නිමන්තගේ මුළු ලකුණු ලබා ගත් පසු අනිත් සිසුන්ගේ මුළු ලකුණු ලබා ගැනීමට අනුගමනය කළ යුතු පියවර ලියන්න.

III. I පත්‍රය සඳහා ලබාගත් ඉහළ ම ලකුණ සෙවීමට C9 කෝෂයට ඇතුළත් කළ යුතු ශ්‍රිතය කුමක්ද?

IV. II පත්‍රය සඳහා ලබාගත් අවම ලකුණ සෙවීමට D10 කෝෂයට ඇතුළත් කළ යුතු ශ්‍රිතය කුමක්ද?

V. III පත්‍රය සඳහා පෙනී සිටීමට නියමිතව සිටි පන්තියේ මුළු සිසුන් ගණන සෙවීමට E12 කෝෂයට ඇතුළත් කළ යුතු ශ්‍රිතය සඳහන් කරන්න.

0718961214

8. ඉලෙක්ට්‍රොනික සමර්පණ - 10 ශ්‍රේණිය

සැකසුම -: ජී.එස්.එම්.මහේෂිකා පාසල -: අම්/උහන ජාතික පාසල, උහන

❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. ඉ- සමර්පණයක නව කදාවක් ඇතුල් කිරීමට භාවිතා කරන කෙටි මං යතුරු වන්නේ,

(1) Ctrl+N (2) Ctrl+M (3) Shift+M (4) Shift+N

02. ඉ- සමර්පණයක දක්නට නොලැබෙන ලක්ෂණය වන්නේ,

(1) අක්ෂර වින්‍යාසය නිවැරදි බව සෙවීම (2) වචන සෙවීම

(3) තැපැල් මුසුව (4) බුලට් ලැයිස්තු යෙදීම

03. ඉ- සමර්පණයක ගොනුවේ දිගුව වන්නේ,

(1) exe (2) accdb (3) docx (4) pptx

04. ඉ - සමර්පණ මෘදුකාංගයක කදා පිරිසැලසුම් මෙවලම සඳහා භාවිතා කරන්නේ පහත මෙවලම් අතරින් කුමක්ද ?

(1) (2) (3) (4)

05. ඉ-සමර්පණ ගොනුවක් සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) සමර්පණයකට හඬපට ඇතුළත් කළ නොහැක.

(2) සජීවන (animation) ඇතුලත් කළ හැක්කේ පින්තූර වලට පමණි.

(3) කදා සංක්‍රාන්ති (slide transition) යනු කදා මාරු කිරීමේදී සිදු කරන වෙනස් චලනයන් වේ.

(4) නව කදාවක් ඇතුලත් කිරීමට Shift+F3 යන කෙටි මං යතුර යොදා ගනී.

06. ඉ - සමර්පණ මෘදුකාංගක යන උපාංගයෙන් සිදු වන්නේ,

(1) slide show එක තෝරා ඇති කදාවක සිට ආරම්භ කිරීම. (2) slide show එක මුල සිට ආරම්භ කිරීම.

(3) අවශ්‍ය කදා පමණක් slide show ආකාරයට ආරම්භ කිරීම. (4) ඉහත සියල්ලම නිවැරදිය.

07. Slide Show එකක් මුල සිට ආරම්භ කිරීමට අදාල යතුර වන්නේ,

(1) Shift+F5 (2) F5 (3) F1 (4) F3

08. මේ අතරින් ඉ- සමර්පණ මෘදුකාංගයක් වන්නේ,

(1) Numbers (2) Apple Keynote (3) Oracle (4) Frame Maker

09. විද්‍යුත් සමර්පණයක දසුන් කිහිපයක් රූපයේ දැක්වේ. ඒවා පිළිවෙලින් දැක්වෙන්නේ,



(1) කියවීම් දසුන, කදා සුබෙදුම් දසුන, සාමාන්‍ය දසුන, සමර්පණ රාමු දසුන

(2) සාමාන්‍ය දසුන, කදා සුබෙදුම් දසුන, කියවීම් දසුන, සමර්පණ රාමු දසුන

(3) සමර්පණ රාමු දසුන, කියවීම් දසුන, සාමාන්‍ය දසුන, කදා සුබෙදුම් දසුන

(4) ඉහත යම් අංග සමර්පණවල නොමැත.

10. ඉ - සමර්පණයක කදාවක අකුරු, පින්තූර සඳහා,

A – Animation යෙදිය හැකිය.

B – Transition යෙදිය හැකිය.

C - පින්තූර සඳහා animation යෙදිය හැකි මුත් අකුරු සඳහා animation යෙදිය නොහැක.

(1) A පමණි (2) B පමණි (3) C පමණි (4) ඉහත සඳහන් සියල්ලම නිවැරදිය

01. පහත දැක්වෙන ඉ - සමර්පණ ආශ්‍රිත කාර්යයන් සඳහා භාවිතා කරන යතුරු ගලපන්න.

I.	නව slide එකක් ආරම්භ කිරීම	Ctrl +B
II.	නව power point presentation එකක් ආරම්භ කිරීම	Pagedn
III.	Hyperlink එකක් ඇතුලත් කිරීම	Pageup
IV.	Slide show එක අවසන් කිරීම	F5
V.	Slide show එක ආරම්භ කිරීම	Ctrl+N
VI.	පෙර slide එකට යාම	Ctrl+M
VII.	ඊළඟ slide එකට යාම	Ctrl+K
VIII.	අකුරු bold කිරීම	Esc

02. පහත දැක්වෙන ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න ඉදිරියෙන් සඳහන් කරන්න.

I. ඉ- සමර්පණ සඳහා ශබ්ද ගොනු ඇතුළත් කළ හැකිය. ....
II. ඉ- සමර්පණ සඳහා වීඩියෝ ඇතුලත් කළ නොහැකිය. ....
III. Transition යනු slide වලට යෙදිය හැකි චලන දෘෂ්ටි ක්‍රමයකි. ....
IV. කදාවක ඇති පින්තූරයක් චලනය කළ නොහැක. ....
V. ඉ- සමර්පණ නිර්මාණයේදී එක් කදාවකට සීමිත පින්තූර ප්‍රමාණයක් හා වචන ප්‍රමාණයක් ඇතුලත් කිරීම වඩා සුදුසුයි. ....

03. ඉ- සමර්පණ මෘදුකාංග වල ඇති මෙවලම් ඒවායේ කාර්යය සමග ගලපන්න.

මෙවලම	**මෙවලමෙන් කරන කාර්යය**
	කදාවකට අධිසන්ධානයක් ඇතුලත් කිරීම.
	දැනට තෝරාගෙන තිබෙන කදාවක් සම්පූර්ණ කවුළුව පුරා දැක බලා ගැනීම
	අලුත් කදාවක් ලබා ගැනීම.
	කදාවකට ශබ්ද ඇතුළත් කිරීම.
	කදාවකට සජීවීකරණ ඇතුලත් කිරීම.
	කදා පසුතලය නිර්මාණය කිරීම.
	කදාවකට වීඩියෝ අන්තර්ගත කිරීම.

04. පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. සමර්පණයක් යනු කුමක්ද ?
II. ගුණාත්මක ඉ - සමර්පණයක අඩංගු විය යුතු ලක්ෂණ ලියා දක්වන්න.
III. ඉ - සමර්පණ මෘදුකාංග යනු කවරේදැයි හඳුන්වන්න.
IV. ඉ - සමර්පණ මෘදුකාංග සඳහා උදාහරණ දෙන්න.
V. හරිත පරිගණක යනු කවරේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

05. පහත දැක්වෙන ඉ - සමර්පණ මෘදුකාංගයේ දැක්වෙන ආකාරයට ඉ - සමර්පණයකට ඇතුලත් කළ හැකි යම් යම් දත්ත හා තොරතුරු වර්ග මොනවාද ?



9. දත්ත සමුදාය - 10 ශ්‍රේණිය

සැකසුම -: ජී.එස්.එම්.මහේෂිකා　　　　පාසල -: අම්/උහන ජාතික පාසල, උහන

❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. ප්‍රාථමික යතුරක් සඳහා යෙදිය හැකි ක්ෂේත්‍රයක් වන්නේ,

(1) සිසුවාගේ නම　(2) ලිපිනය　(3) වයස　(4) ඇතුලත්වීමේ අංකය

02. එක් වගුවක ක්ෂේත්‍රයක් වෙනත් වගුවක පේළි අනන්‍යව හඳුනාගනී නම් එම ක්ෂේත්‍රය හඳුන්වන්නේ,

(1) ප්‍රාථමික යතුර　(2) ආගන්තුක යතුර　(3) සංයුක්ත යතුර　(4) දත්ත සමුදාය යතුර

03. යම් රෙකෝඩයක් අනන්‍යව හඳුනාගැනීමට එක් ක්ෂේත්‍රයක් ප්‍රමාණවත් නොවූ විට, ක්ෂේත්‍ර කිහිපයක් සම්බන්ධ කර සාදන යතුර වන්නේ මින් කුමන යතුර ද ?

(1) සංයුක්ත යතුර　(2) දත්ත සමුදාය යතුර　(3) ප්‍රාථමික යතුර　(4) ආගන්තුක යතුර

04. ඉලෙක්ට්‍රොනික දත්ත සමුදායක වාසියක් නොවන්නේ,

(1) තොරතුරු සෙවීම කාර්යක්ෂමවීම.　(2) වෛරස්වලින් තොරතුරු ආරක්ෂා කිරීම

(3) දත්ත උපස්ථ කිරීමට (backup) පහසුවීම.　(4) දත්ත හවුලේ භාවිතය

05. දත්ත ගුප්ත කේතනය යනු ,

(1) දත්ත වෛරස් වලින් ආරක්ෂා කරන ක්‍රමයකි.

(2) දත්ත උපස්ථ කිරීමේ ක්‍රමයකි.

(3) අනවසර පුද්ගලයින්ට කියවිය නොහැකි පරිදි දත්ත පරිවර්ථනය කිරීමකි.

(4) දත්ත අන්තර්ජාලය හරහා ගමන් කරන විට ඇති කරන ක්‍රියාවලියකි.

06. දත්ත සමුදාය කළමණාකරණ මෘදුකාංගක යන උපාංගය හඳුන්වන්නේ,

(1) Data Sheet view　(2) Query Wizard　(3) Design view　(4) Report Design

07. සම්බන්ධිත දත්ත සමුදායක තනි පුද්ගලයෙකුට අදාල දත්ත ඇතුලත් ක්ෂේත්‍ර කිහිපයක් හඳුන්වන නාමය,

(1) රෙකෝඩයකි　(2) ක්ෂේත්‍රයකි　(3) වගුවකි　(4) සංයුක්ත යතුරකි

08. මේ අතරින් දත්ත සමුදාය කළමණාකරණ පද්ධතියක් නොවන්නේ,

(1) Access　(2) Apple Keynote　(3) Oracle　(4) Base

09. දත්ත අනුපිටපත්වීම (Data Duplication) නිසා සිදුවන බලපෑමක් නොවන්නේ,

(1) රෙකෝඩ වල අනන්‍යතාවය පවත්වා ගැනීමට නොහැකි වීම.

(2) නිවැරදිව දත්ත විශ්ලේෂණය කිරීමට නොහැකි වීම.

(3) දත්ත සමුදායේ කාර්යක්ෂමතාව අඩුවීම.

(4) දත්ත උපස්ථ කිරීමට (backup) නොහැකිවීම.

10. දත්ත සමුදාය කළමණාකරණ පද්ධතියක දක්නට නොලැබෙන ලක්ෂණය/ලක්ෂණ වන්නේ,

A – විමසීම (Query)　B – තේරීම (Select)

C - මැකීම (Delete)　D - දත්ත යාවත්කාලීන කිරීම (Update)

(1) C පමණි　(2) D පමණි　(3) A,B,C,D සියල්ලම නිවැරදිය　(4) ඉහත කිසිවක් නැත

01. පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. දත්ත සමුදායක් යන්න නිර්වචනය කරන්න.
II. දත්ත සමුදාය කළමණාකරණ පද්ධතියක වාසි මොනවාද ?
III. දත්ත සමුදායක ලක්ෂණ මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.
IV. දත්ත අනුපිටපත් වීම යනු කවරේද ?
V. දත්ත සමුදාය කළමණාකරණ පද්ධති මෘදුකාංග සඳහා උදාහරණ දෙන්න.

02.

I. ඉලෙක්ට්‍රොනික දත්ත සමුදාය කළමණාකරණ පද්ධතියක හා අත්යුරු දත්ත සමුදාය පද්ධතියක ඇති වෙනස්කම් වගුගත කරන්න.

අත්යුරු දත්ත සමුදාය	ඉලෙක්ට්‍රොනික දත්ත සමුදාය



II. A,B,C සඳහා සුදුසු පද යොදමින් සම්බන්ධිත දත්ත සමුදාය සම්පූර්ණ කරන්න.

03. පහත දැක්වෙන්නේ ව්‍යාපාරික තොරතුරු ඇතුළත් දත්ත සමුදාය කළමණාකරණ පද්ධතියකි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

Sales Table		
Month	Shop ID	Sales
January	001	12400
March	001	18700
December	003	15330
February	001	11230
March	002	16330

Category Table	
Category	Items
A	Ice cream & Milk
B	Milk
C	Milk & Stationery

Branch Table		
Name	Shop ID	Category
ABC College	001	A
PQR College	002	B
XYZ College	003	C

I. මෙම වගුවල ඇති රෙකෝඩ හා ක්ෂේත්‍ර ගණන වෙන් වෙන්ව සඳහන් කරන්න.
II. මෙම වගුවල අන්තර්ගත ප්‍රාථමික යතුරු හා ආගන්තුක යතුරු 2 ක බැගින් ඒවාට අදාළ වගු සමග ලියා දක්වන්න.
III. එක් එක් වෙළඳසැලේ දුරකතන අංකය ඇතුලත් කිරීමට අවශ්‍ය නම්, වෙනස් කළ යුතු වගුව කුමක්ද ?
IV. ABC college හි total Sales සොයා ගැනීම සඳහා විමසුමක් ක්‍රියාත්මක කිරීමට බද්ධ කළ යුතු වගු මොනවාද ?
V. Shop ID 004 වූ නව වෙළඳ සැලක් Milk & Photocopying අලෙවිය සඳහා MNO College හි විවෘත කළේ නම්, මෙම තොරතුරු ඇතුලත් කිරීම සඳහා යාවත්කාලීන කළ යුතු වගු මොනවාද ?
VI. ඉහත (V) හි සඳහන් අළුතින් එකතු කරන ලද රෙකෝඩ ඒවාට අදාළ වගු නාම සමගින් ලියා දක්වන්න.

04. දත්ත සමුදාය කළමණාකරණ පද්ධතියක් ආශ්‍රයෙන් සැකසූ පහත රූප සටහන්වල හිස්තැන් පුරවන්න.

ක්ෂේත්‍රය	දත්ත ප්‍රරූපය
ඇතුළත්වීමේ අංකය	
නම	
උපන් දිනය	
මාසික වැටුප	
ස්ත්‍රී /පුරුෂ භාවය	
ලියාපදිංචි වී ඇත් ද ?	
හැඳුනුම්පත් අංකය	
දිනය	
වැඩකළ දින ගණන	



Software (මෘදුකාංගය)	Company (නිෂ්පාදන ආයතනය)
Access	....
....	The Document Foundation
Oracle	....

05. පහත දැක්වෙන ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න ඉදිරියෙන් සඳහන් කරන්න.

I. අවම වශයෙන් එක් පොදු ක්ෂේත්‍රයක් වගු දෙකෙහිම පැවතීම දත්ත පාදකයක වගු දෙකක් අතර සම්බන්ධතාවය ගොඩගැනීමට අවශ්‍ය වේ. ....
II. දත්ත සමුදාය කළමණාකරණ පද්ධතිවල දී වගුවට දත්ත ආදානය කිරීමට විමසුම භාවිතා කරයි. ....
III. වගුවක රෙකෝඩ අනන්‍යව හඳුනාගත හැකි තීරුවක් (තීරු සංයෝජනයක්) ප්‍රාථමික යතුර ලෙස හැඳින්වේ. ....
IV. වාර්තා පහසුවෙන් නිර්මාණය කිරීම සඳහා Report Wizard භාවිතා කරයි. ....
V. එකිනෙකට සම්බන්ධිත වගුවල දත්තවලින් අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා ආකෘති පත්‍ර යොදා ගනී. ....

0773530145